# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1904/42 - 2015 මාර්තු මස 04 වැනි බදාදා - 2015.03.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, නාගරික සංවර්ධන, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මහනුවර උතුර - පාතදුම්බර ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියේ සයින්ස්ටන් සේවා ජලාශයේ ප්‍රවේශ මාර්ගය ඉදි කිරීම සඳහා ඉඩම් කොටසක පරවශතාව අත් කර ගැනීමට අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසෙහි පරවශතා අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නාගරික සංවර්ධන, ජල සම්පාදන
හා ජලාපවහන අමාත්‍ය.

2015 පෙබරවාරි මස 24 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නාගරික සංවර්ධන, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1053

#### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අලවතුගොඩ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, සයින්ස්ටන් වතුයාය ගමේ පිහිටි, බලය ලත් මිනින්දෝරු වී. එන්. රණසිංහ මහතා විසින් මැන සකස් කරන ලද අංක 13/55 දරන බලයලත් මිනින්දෝරු සැලැස්මේ කැබලි අංක 2 ලෙස දැක්වෙන මුළු ප්‍රමාණයෙන් පර්චස් 14 ක් පමණ වන "පැල්පොල වත්ත" නමැති ඉඩමෙන් පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස :

කැබලි අංක 2
ඉඩමේ නම : පැල්පොල වත්ත
ප්‍රමාණය : පර්චස් 14

මායිම්

| | | |
|---|---|---|
| *උතුරට* | : | අලවතුගොඩ සිට මල්ගම්දෙනිය දක්වා වැටී ඇති මාර්ගය හා මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *නැගෙනහිරට* | : | එච්. එම්. ජී. වෙලගෙදර හිමිකම් කියන මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *දකුණට* | : | එච්. එම්. ජී. වෙලගෙදර හිමිකම් කියන මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *බටහිරට* | : | එච්. එම්. ජී. වෙලගෙදර හිමිකම් කියන මෙම ඉඩමේ ඉතිරි කොටස. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය:* 1. එච්. එම්. ජී. වෙලගෙදර මහතා
අංක 90 1/29, අම්පිටිය පාර, මහනුවර.

03 - 573

1A - G 21144 — 25 (2015/03)
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, නාගරික සංවර්ධන, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මහනුවර උතුර - පාතදුම්බර ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියේ සයින්ස්ටන් සේවා ජලාශය ඉදි කිරීම සඳහා ඉඩම් කොටසක් අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටස් වල නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නාගරික සංවර්ධන, ජල සම්පාදන
හා ජලාපවහන අමාත්‍ය.

2015 පෙබරවාරි මස 24 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නාගරික සංවර්ධන, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1055

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අලවතුගොඩ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, සයින්ස්ටන් වතුයාය ගමේ පිහිටි, බලය ලත් මිනින්දෝරු වී. එන්. රණසිංහ මහතා විසින් මැන සකස් කරන ලද අංක 13/55 දරන බලයලත් මිනින්දෝරු සැලැස්මේ කැබලි අංක 1 හි කොටසක් ලෙස දැක්වෙන මුළු ප්‍රමාණයෙන් පර්චස් 15 ක් පමණ වන "පැල්පොල වත්ත" නමැති ඉඩමෙන් පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස :

කැබලි අංක 1 න් කොටසක්
ඉඩමේ නම : පැල්පොල වත්ත
ප්‍රමාණය : පර්චස් 15

මායිම්

| | | |
|---|---|---|
| *උතුරට* | : | එච්. එම්. ජී. වෙලගෙදර හිමිකම් කියන මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *නැගෙනහිරට* | : | එච්. එම්. ජී. වෙලගෙදර හිමිකම් කියන මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *දකුණට* | : | එච්. එම්. ජී. වෙලගෙදර හිමිකම් කියන මෙම ඉඩමේ ඉතිරි කොටස හා සයිස්ටන් සේවා ජලාශය සඳහා යෝජිත ප්‍රවේශ මාර්ගය ; |
| *බටහිරට* | : | එච්. එම්. ජී. වෙලගෙදර හිමිකම් කියන මෙම ඉඩමේ ඉතිරි කොටස. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය:* 1. එච්. එම්. ජී. වෙලගෙදර මහතා
අංක 90 1/29,
අම්පිටිය පාර,
මහනුවර.

03 - 574

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, නාගරික සංවර්ධන, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, ජාතික ජල සම්පාදන හ ජලාපවහන මණ්ඩලයේ මහනුවර උතුර - පාතදුම්බර ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියේ ජම්බුගහපිටිය සේවා ජලාශය ඉදි කිරීම සඳහා අතිරේක ඉඩම් කොටසක් අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටස් වල නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නාගරික සංවර්ධන, ජල සම්පාදන
හා ජලාපවහන අමාත්‍ය.

2015 පෙබරවාරි මස 24 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නාගරික සංවර්ධන, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1057

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 625, අළුත්ගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, අළුත්ගම ගමේ පිහිටි, සර්වේයර් ජෙනරාල් විසින් මැන සකස් කරන ලද අංක පී. පී. ඒ. 1742 දරන පිඹුරේ කැබලි අංක 127 හි කොටසක් ලෙස දැක්වෙන මුළු ප්‍රමාණයෙන් පර්චස් 8 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ පිහිටි "වුඩ් හෝප් වත්ත හෙවත් වුඩ් කෝප් වත්ත" නමැති ඉඩම් කොටස :

ඉඩමේ නම : වුඩ් හෝප් වත්ත හෙවත් වුඩ් කෝප් වත්ත
ප්‍රමාණය : පර්චස් 8

මායිම්

*උතුරට* : ජම්බුගහපිටිය සේවා ජලාශය සඳහා අත් කර ගැනීමට යෝජිත මෙම ඉඩමේ ඉතිරි කොටස ;
*නැගෙනහිරට* : පී. පී. ඒ. 1742 හි කැබලි අංක 107 (වන රක්ෂිතය) ;
*දකුණට* : මෙම ඉඩමේ ඉතිරි කොටස හා නිවාස දක්වා යන පාර ;
*බටහිරට* : මෙම ඉඩමේ ඉතිරි කොටස.

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය:* 1. ඩී. ජී. පැලිස් මහතා
අංක 1/92,
අළුත්ගම,
ජම්බුගහපිටිය.

03 - 575

### 1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, නාගරික සංවර්ධන, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, ජාතික ජල සම්පාදන හ ජලාපවහන මණ්ඩලයේ මහනුවර උතුර - පාතදුම්බර ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියේ මාවතපොල පොම්පාගාරය ඉදි කිරීම සඳහා ඉඩම් කොටසක් අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටස් වල නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නාගරික සංවර්ධන, ජල සම්පාදන
හා ජලාපවහන අමාත්‍ය.

2015 පෙබරවාරි මස 24 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නාගරික සංවර්ධන, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අලවතුගොඩ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මාවතපොල ගමේ පිහිටි, බලය ලත් මිනින්දෝරු වී. එන්. රණසිංහ මහතා විසින් මැන සකස් කරන ලද අංක 13/66 A දරන බලයලත් මිනින්දෝරු සැලැස්මේ කැබලි අංක 1 හි කොටසක් ලෙස දැක්වෙන "සයිස්ටන් වත්ත" නැමති ඉඩමෙන් මුළු ප්‍රමාණයෙන් පර්චස් 10 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස :

කැබලි අංක 1 න් කොටසක්
ඉඩමේ නම : සයිස්ටන් වත්ත
ප්‍රමාණය : පර්චස් 10

මායිම්

*උතුරට* : මෙම ඉඩමේ ඉතිරි කොටස හා අඩි පාර ;
*නැගෙනහිරට* : අඩි පාර ;
*දකුණට* : අලවතුගොඩ මාවතපොල පාර හා අඩි පාර ;
*බටහිරට* : අලවතුගොඩ මාවතපොල පාර හා මෙම ඉඩමේ ඉතිරි කොටස.

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය:* 1. එම්. එච්. ෆාතිමා මිය,
අංක 75 සී,
මාවතපොල,
අලවතුගොඩ.

03 - 576

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.